**කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

**වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය**

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍යය) උපාධි පළමු පරීක්ෂණය (බාහිර) - 2022

අප්‍රේල් - 2024

**BMGT E1025 - ව්‍යාපාර ගිණුම්කරණය**

ප්‍රශ්න සංඛ්‍යාව : හතරයි (04) කාලය : පැය 03 යි

**සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

වැඩසටහන්ගත නොකළ ගණකයන්ත්‍ර පමණක් භාවිතා කළ හැකිය.

**ප්‍රශ්න අංක 01**

"ජනහිත" ස්ටෝර්ස් සමනළට අයත් තනි පුද්ගල ව්‍යාපාරයකි. 2020 මාර්තු 31 දිනට ජනහිත ස්ටෝර්ස් හි ශේෂ පිරික්සුම සමාන නොවූ අතර, එහි වෙනස වූ රු 49, 500 අවිනිශ්චිත ගිණුමකට හර කරන ලදී. ඉන් අනතුරුව කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කල අතර 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන අනුව වාර්තා කල ශුද්ධ ලාභය රු. 1,350,000/- ක් විය.

පහත සඳහන් වැරදි පසුව හඳුනාගන්න ලදී.

(1) 2020 මාර්තු 31 දින රු. 95,000/= පිරිවැයකට ණය පදනම මත මිලදී ගන්න ලද පරිගණකයක්, පරිගණක ගිණුමෙහි රු. 9500/= ලෙස හර කර තිබුණි. එහි බැර සටහන ණයහිමි ගිණුමෙහි නිවැරදිව සටහන් කර තිබුණි.

(2) රු. 76,000 ක අත්පිට මුදලට ගැනුම්, මුදල් පොතට නිවැරදිව බැර කර තිබුණි. ඊට අදාල හර සටහන වාර්තා කර නොතිබුණි.

(3) 2020 මාර්තු 31 දින දරණ ලද රු. 66,000/= ක් වූ කාර්යාල නඩත්තු වියදම මුදල් පොතෙහි නිවැරදිව වාර්තා කර තිබුනු නමුත් එය කාර්යාල උපකරණ ගිණුමට හර කර තිබුණි.

(4) රු. 112,000/- ක් මොටර් රථ ක්ෂය වීම් අදාල ක්ෂය වියදම් ගිණුමට දෙවරක් හර කර තිබූ අතර, ඊට අදාල බැර සටහන නියමිත ලේජර් ගිණුමෙහි නිවැරදිව සටහන් කර තිබුණි.

(5) විකුණුම් ජර්නලය රු. 225,000/- ක් අඩුවෙන් එකතු කර තිබුණි.

ඔබ විසින් කළ යුත්තේ,

I. (අ) ඉහත සඳහන් වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය ජර්නල් සටහන් පිළියෙළ කරන්න.

**(ලකුණු 08)**

II. (ආ) 2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා නිවැරදි කළ ශුද්ධ ලාභය ගණනය කරන්න.

**(ලකුණු 04)**

III පහත දක්වා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ප්‍රශ්න අංක සමග ඔබට සපයා ඇති පිළිතුරු පත්‍රයේ සපයන්න.

අ) නිමලසිරි හාඩ්වෙයාර් විසින් 2018 අප්‍රේල් 01 දින රු. 400,000/- කට යන්ත්‍රයක් මිලදී ගන්න ලදී. ආයතනයේ ප්‍රතිපත්තිය වනුයේ හීන වන ශේෂ ක්‍රමය භාවිත කර යන්ත්‍ර ක්ෂය කිරීම වේ. අදාල ක්ෂය අනුපාතය වර්ෂයකට 25% වන්නේ නම් 2020 මාර්තු 31 දිනෙනේ අවසන් වර්ෂය සඳහා අය කරනු ලබන ක්ෂය වියදම ගණනය කරන්න.

ආ) 'සංගතතා සංකල්පය' කෙටියෙන් පැහැදිලි කරන්න.

ඇ) පොදු ජර්නලය තුල වාර්තා කරනු ලබන ගනුදෙනු වර්ග දෙකක් සඳහන් කරන්න.

ඈ) පහත සඳහන් තොරතුරු වතුර ට්‍රේඩර්ස්හි පොත් වලින් 2020 මාර්තු මාසයට අදාලව උපුටගේනේ ඇත.

| | රු. |
|---|---|
| 2020 මාර්තු 31 දිනට ණය හිමි පාලන ගිණුමේ ශේෂය | 875,000 |
| මාර්තු මාසය සඳහා මිලදී ගැනුම් ජර්නලය යේ එකතුව | 2,350,000 |
| මාර්තු මාසය සඳහා විකුණුම් ජර්නලය යේ එකතුව | 3,450,000 |
| මාර්තු මාසය සඳහා ආපසු යවෙම් ජර්නලයේ එකතුව | 575,000 |
| මාර්තු මාසය සඳහා ණය හිමියන්ට සිදුකල ගෙවීම් | 1,450,000 |

ඉහත සඳහන් තොරතුරු වලට අනුව 2020 මාර්තු 31 දිනට ණය හිමි පාලන ගිණුමෙ ශේෂය ගණනය කරන්න.

(ලකුණු 02* 4 = 08 )

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 02

ඈ) 2019 අප්‍රේල් 01 දින ලියනගේ විසින් තනි පුද්ගල ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. ව්‍යාපාරයට ඔහු විසින් මොටර් ලොරියක් යොදන ලද අතර ප්‍රග්ධනය ලෙස රු. 1,500,000/- ක් මුදලක් එදිනම බැංකු ගිණුමක් ආරම්භ කර තැම්පත් කරන ලදී.

ව්‍යාපාරයේ පොදු ජර්නලයෙන් පහත සඳහන් ජෙර්නල් සටහන් උපුටා ගන්න ලදී.

| | හර | බැර |
|---|---|---|
| මොටර් ලොරිය | 1,740,000 | |
| ප්‍රාග්ධන ගිණුම | | 1,740,000 |
| 2019 අප්‍රේල් 01 දින ඓතිකරු විසින් මොටර් රථයක් ව්‍යාපාරය යෙදවීම. | 1,740,000 | 1,740,000 |

2020 මාර්තු 31 දින අවසන් වර්ෂය සඳහා මුදල් පොත පහත පරිදි වේ.

| | රු. | | රු. |
|---|---|---|---|
| ප්‍රග්ධනය | 1,500,000 | ණය හිමියන් ට ගෙවීම් | 3,850,000 |
| වෙළඳ ණය ගැති ලැබීම් | 3,200,000 | බදු කුලී | 864,000 |
| අත්පිට විකුණුම් | 4,118,000 | විදුලිය හා ජලය | 258,000 |
| | | වේතන හා වැටුප් | 1,810,000 |
| | | ශේෂය ප/ගේ | 2,036,000 |
| | **8,818,000** | | **8,818,000** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත

1. 2020 මාර්තු 31 දිනට ගිණුම් පොත් වල පහත සඳහන් ශේෂයයන පැවතුනි.

| | රු. |
|---|---|
| වෙළඳ ණය ගැතියන් | 975,000 |
| වෙළඳ ණය හිමියන් | 1,240,000 |
| ගෙවිය යුතු විදුලිය හා ජලය | 15,000 |

2. මොටර් ලොරිය පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට වාර්ෂිකව 20% බැගින් ක්ෂය කරනු ලැබේ.

3. 2020 මැය 31 න් අවසන් මස 12 ක කාලය සඳහා වන බදු කුලිය 2019 ජුනි 01 දින ගෙවන ලදී.
4. 2020 මාර්තු 31 දිනට කිසිදු තොගයක් නොතිබිණි.

අවශ්‍ය වන්නේ,

2020 මාර්තු 31 දිනට ලියනගේ ව්‍යාපාරයේ ශේෂ පිරික්සුම පිළියල කරන්න.

**(ලකුණු 10)**

ආ) පාසල් බෑග් නිෂ්පාදන සමාගමක් වන AMW හි, 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත සඳහන් තොරතුරු සපයා ඇත.

| විස්තරය | රු. |
|---|---|
| 2019 අප්‍රේල 01 දිනට තොගය | |
| අමුද්‍රව්‍ය | 810,000 |
| නොනිමි ද්‍රව්‍ය (ප්‍රාථමික පිරිවැයට අගය කල ) | 445,000 |
| අමුද්‍රව්‍ය මිලදී ගැනුම් | 2,850,000 |
| විදුලි වියදම් | 275,000 |
| ජල වියදම් | 200,000 |
| කර්මාන්ත ශාලා බදු කුලී | 225,000 |
| රක්ෂණ වියදම් | 300,000 |
| සෘජු වැටුප් | 1,270,000 |
| කර්මාන්ත ශාලා යන්ත්‍ර සඳහා වන ඉන්ධන | 130,000 |
| කර්මාන්ත ශාලා කළමනාකරුවන්ගේ වේතන | 860,000 |
| කර්මාන්ත ශාලා යන්ත්‍ර මත ක්ෂය වීම් | 270,000 |

පහත සඳහන් අතිරේක තොරතුරු සපයා ඇත

(1) 2020 මාර්තු 31 දිනට තොගය පහත පරිදි ගණනය කර ඇත.

| විස්තරය | පිරිවැය (රු.) |
|---|---|
| අමුද්‍රව්‍ය ස්ටෝර්ස් | 900,000 |
| නොනිමි ද්‍රව්‍ය (ප්‍රාථමික පිරිවැයට අගය කල ) | 690,000 |

(2) පහත සඳහන් වියදම් කර්මාන්ත ශාලාව අතර සහ කාර්යාල අතර පහත පරිදි බෙදා වෙන් කල යුතුය.

| වියදම් | කර්මාන්ත ශාලාව | කාර්යාලය |
|---|---|---|
| විදුලි වියදම් | 80% | 80% |
| ජල වියදම් | 75% | 25% |
| රක්ෂණ වියදම් | 90% | 100% |

(3) නිමකරන ලද පාසල් බෑග් , පිරිවැය මත 20% ක ලාභාන්තිකයක් සහිතව විකුණුම් අංශයට මාරු කරනු ලැබේ.

අවශ්‍ය වන්නේ,

2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා AMW හි නිෂ්පාදන ගිණුම් පිළියෙල කරන්න.

**(ලකුණු 10)**

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 03**

අ) දමිත් සහ උදිත් ලාභ'ලාභ පිළිවලින් 4:2 අනුපාතයට බෙදාගනිමින් DU ෆැෂන් නම් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබයි. 2023 ජනවාරි 01 දින, රු. 8,000,000/- ක මූලික මුදල් ආයෝජනයක් සමඟ මීනා හවුලට සහභාගී විය.

I. පහත සඳහන් ශේෂයන් හවුල් ව්‍යාපාරයේ පොත් වලින් උපුටාගෙන තිබේ.

**(රු '000)**

| | හර | බැර |
|---|---|---|
| 2023 ජනවාරි 01 දිනට ප්‍රාග්ධන ගිණුම | | |
| දමිත් | | 12,000 |
| උදිත් | | 8,000 |
| 2023 ජනවාරි 01 දින මීනා රැගෙන ආ ප්‍රාග්ධනය | | 8,000 |
| 2023 ජනවාරි 01 දිනට ජංගම ගිණුම | | |
| දමිත් | | 1,500 |
| උදිත් | 800 | |

| | | |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී ගැනිලි | | |
| දමිත් | 900 | |

II. 2023 ජනවාරි 01 වන දින හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 2,400,000 කට අගය කරන ලද අතර එය කීර්තිනාම ගිණුමක් විවෘත නොකර හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම හරහා ගැලපීමට තීරණය කරන ලදී.

III. හවුල් ව්‍යාපාරයේ ජංගම නොවන වත්කම් 2023 ජනවාරි 01 වන දින පහත පරිදි ප්‍රත්‍යාගණනය කරන ලදී.

**(රු.'000)**

| | **2023 ජනවාරි 01 දිනට ප්‍රත්‍යාගණිත අගය** | පිරිවැය | **2023 ජනවාරි 01 දිනට සමුච්චිත ක්ෂය** |
|---|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 6,000 | 4,000 | 600 |
| මෝටර් වාහන | 1,400 | 2,000 | 1,000 |

ජංගම නොවන වත්කම්, ප්‍රත්‍යාගණිත අගයන් යටතේ හවුල් ව්‍යාපාරයේ ගිණුම් වල පවත්වාගෙන යාමට ඒකඟ වන ලදී.

IV. නව හවුල් ව්‍යාපාරයේ ගිවිසුමෙහි පහත සඳහන් දෑ ඇතුලත් වේ :

- 2023 ජනවාරි 01 වන දිනට ඇති ප්‍රාග්ධන ගිණුම්වල ශේෂයන් මත වාර්ෂිකව 10% බැගින් වූ ප්‍රාග්ධන පොලියක් ගෙවනු ලැබේ
- උදිත්ට මාසිකව රු. 80,000.00 ක වැටුපක් ලැබීමට හිමිකම් ඇත
- දමිත්, උදිත් සහ මීනා අතර ලාභ'ලාභ පිළිවලින් 8:6:6 අනුපාතයට බෙදාගත යුතුය

V. 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ශුද්ධ ලාභය රු. 6,480,000 ක් විය.

ඔබ විසින් කළ යුතු දෑ ;

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත සඳහන් දෑ පිළියල කරන්න.

(i) හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් (ලකුණු 05)

(ii) හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් (ලකුණු 05)

ආ) හවුල් ව්‍යාපාර ගිණුම්කරණ දැනුම භාවිතා කරමින් පහත සඳහන් එක් එක් ප්‍රකාශ සම්පූර්ණ කරන්න..

I. හවුල් ගිවිසුමේ ලාභ-අලාභ අනුපාතයක් නියම කර නොමැති නම්, __________ ලාභ සහ අලාභ වෙන් කරනු ලැබේ.

II. හවුල් ව්‍යාපාරයක ලක්ෂණ පහ වන්නේ a)._______, b). ______, c). _________, d). _______, සහ e). _______.

III. ______________________________ යනු හවුල්කාරිත්වය වෙනුවෙන් ගිවිසුම්ගත වීමට ඕනෑම හවුල්කරුවෙකුට ඇති හැකියාවයි.

IV. නව හවුල්කරුවෙකු ඇතුළත් කළ විට හෝ පවතින හවුල්කරුවෙකු හවුල්කාරිත්වයෙන් ඉවත් වූ විට __________ කිරීමක් සිදු වේ.

V. හවුල්කරුවෙකුගේ ප්‍රාග්ධන ගිණුමේ හර ශේෂයක් _______ ලෙස හැඳින්වේ.

(ලකුණු 02*5 = 10)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 04**

සීමිත දමිත පොදු සමාගමේ 2023.03.31 දිනට සාරාංශගත ශේෂ පිරික්සුම පහත දී ඇත.

(රු. `000)

| විස්තරය | හර. | බැර. |
|---|---|---|
| දේපළ, පිරියත හා උපකරණ | 80,000 | |
| 2022.04.01 දිනට සමුච්චිත ක්ෂය - දේපළ, පිරියත හා උපකරණ | | 11,000 |
| විකුණුම් | | 72,200 |
| විකුණුම් පිරිවැය | 43,000 | |
| තොගය | 3,250 | |
| වෙනත් ආදායම් | | 1,800 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 9,100 | |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | | 5,250 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 500 | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් | | 40,000 |
| 2022.04.01 දිනට රඳවාගත් ඉපැයුම් | | 17,700 |

| | | |
|---|---|---|
| ප්‍රත්‍යාගණන සංචිතය - ගොඩනැගිලි | | 5,000 |
| පරිපාලන වියදම් | 8,800 | |
| බෙදාහැරීමේ පිරිවැය | 6,200 | |
| මූල්‍ය පිරිවැය | 1,500 | |
| වෙනත් වියදම් | 600 | |
| ගෙවූ ආදායම් බදු | 900 | |
| 2022.04.01 දිනට ආදායම් බදු සඳහා ප්‍රතිපාදන | | 400 |
| වන්දි සඳහා ප්‍රතිපාදන | | 500 |
| | **153,850** | **153,850** |

අතිරේක තොරතුරු:

2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර පහත දෑ සඳහා ගැළපීම් කළයුතු වේ.

I. 2023.03.31 දිනට තොගය, අයිතම තුනකින් 'සමන්විත වූ අතර, ඒවායේ පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය පහත පරිදි විය.

| අයිතමය | පිරිවැය (රු.'000) | ශුද්ධ උපලබ්ධි අගය (රු.'000) |
|---|---|---|
| A | 1,250 | 1,600 |
| B | 1,200 | 1,100 |
| C | 900 | 550 |
| | **3,350** | **3,250** |

පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට තොග මිනුම් කිරීමේදී අයිතම ක්‍රමය පදනම් කර ගැනීම සමාගමේ ප්‍රතිපත්තිය වේ. කෙසේ වුව ද, මෙම ප්‍රතිපත්තියට පටහැනිව 2023.03.31 දිනට තොගය මිනුම් කර ඇත්තේ මෙම අයිතම තුනෙහිම මුළු පිරිවැය සහ මුළු ශුද්ධ උපලබ්ධි අගය සංසන්දනය කිරීමෙනි. ඒ අනුව තොගයේ පිරිවැය රු. 100 000 කින් කපා හරින ලද අතර, එය වෙනත් වියදම් තුළ ඇතුළත් කර ඇත.

II. ශේෂ පිරික්සුම තුළ දක්වා ඇති වන්දි සඳහා ප්‍රතිපාදනය, සමාගමට එරෙහිව ගනුදෙනුකරුවෙකු විසින් ගොනු කරන ලද නඩුවක් සම්බන්ධයෙන් සිදුකර ඇත.

2023.05.01 දින උසාවිය විසින් තීන්දුව ලබාදුන් අතර, ඒ අනුව සමාගම විසින් රු. 700,000 ක වන්දියක් ගෙවන ලදී. 2023.06.01 දින සමාගමේ අධ්‍යක්‍ෂවරුන් විසින් මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලදී.

III. දේපළ, පිරියත සහ උපකරණවල සංයුතිය සහ ඒවායේ සමුච්චිත ක්‍ෂය පහත පරිදි වේ.

| විස්තරය | **2023.03.31 දිනට පිරිවැය /අගය (Rs.'000)** | **2022.04.01 දිනට සමුච්චිත ක්‍ෂය (Rs.'000)** |
|---|---|---|
| ඉඩම | 30,000 | - |
| ගොඩනැගිලි | 25,000 | 2,000 |
| මෝටර් රථ | 15,000 | 5,000 |
| කාර්යාල උපකරණ | 10,000 | 4,000 |
| | **80,000** | **11,000** |

සියලුම දේපළ, පිරියත සහ උපකරණ පරිපාලන කටයුතු සඳහා භාවිත කෙරේ. 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ක්‍ෂය වෙන් කළ යුතු වේ. මෙම වත්කම්වල සුන්බුන් අගයක් නොමැත. (ක්‍ෂය ගණනය කිරීමේදී අතිරේක තොරතුරු ((IV), (V) සහ (VI) ද සැලකිල්ලට ගත යුතු වේ.)

IV. 2020.03.31 දින ගොඩනැගිලි සහ මෝටර් රථ ප්‍රථමවරට ප්‍රත්‍යාගණනය කරන ලද අතර, එය පොත්වල නිවැරදිව සටහන් කර ඇත. මේ සම්බන්ධ විස්තර පහත දී ඇත.

| | ගොඩනැගිලි | මෝටර් රථ |
|---|---|---|
| ප්‍රත්‍යාගණන අතිරික්තය (Rs.'000) | 5,000 | - |
| ප්‍රත්‍යාගණන ඌනතාවය (Rs.'000) | - | 1,000 |
| ප්‍රථමවරට ප්‍රත්‍යාගණනය කළ දින සිට ඉතිරි ඵලදායී ජීවකාලය (වසර) | 25 | 6 |

2023.03.31 දින ගොඩනැගිලි සහ මෝටර් රථ දෙවන වරට පහත පරිදි ප්‍රත්‍යාගණනය කරන ලදී.

| | ගොඩනැගිලි | මෝටර් රථ |
|---|---|---|
| ප්‍රත්‍යාගණනය අගය (Rs.' 000) | 20,000 | 7,000 |

කෙසේ වුව ද, ගොඩනැගිලි සහ මෝටර් රථ දෙවන වරට ප්‍රත්‍යාගණනය කිරීම සම්බන්ධයෙන් කිසිදු ගිණුම්කරණ සටහනක් තබා නොමැත. 2020.03.31 දිනෙන් පසු ගොඩනැගිලි සහ මෝටර් රථ මිල දී ගැනීම් හෝ ඉවත්කිරීම් සිදු වී නොමැත.

V. 2022.10.01 දින කාර්යාල පරිගණක කිහිපයක් රු. 1,600,000 කට විකුණන ලද අතර, මෙම පරිගණක 2021.10.01 දින රු. 2,000,000 කට මිල දී ගෙන ඇත. සමාගම විසින් කාර්යාල උපකරණ සරල මාර්ග ක්‍රමයට පිරිවැය මත වාර්ෂිකව 20% බැගින් ක්ෂය කරනු ලැබේ. මෙම පරිගණක විකිණීමෙන් ලද මුදල්, මුදල් ගිණුමටහර කර, වෙනත් ආදායම් ගිණුමට බැර කර ඇත. මෙම විකිණීම සම්බන්ධයෙන් වෙනත් කිසිදු ගිණුම්කරණ සටහනක් තබා නොමැත.

VI. ප්‍රවර්තන වාර්ෂය තුළදී පහත දේපළ, පිරියත සහ උපකරණ අයිතම මිල දී ගන්නා ලද අතර, ඒවා නිසි පරිදි ගිණුම්ගත කර ඇත.

| මිල දී ගත් දිනය | අයිතමය | පිරිවැය (Rs.'000) |
|---|---|---|
| 01.07.2022 | ඉඩම | 8,000 |
| 01.10.2022 | ඡායාපිටපත් යන්ත්‍රය | 1,500 |

VII. අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු රු. 1,900,000 ක් සහ සාමාන්‍ය කොටස්කරුවන්ට ගෙවූ රු. 1,100,000 ක අතුරු ලාභාංශ පරිපාලන වියදම් තුළ ඇතුළත් කර ඇත.

VIII. 2022,04.01 දින සමාගම විසින් කල්බදු ගිවිසුමක් යටතේ ගොඩනැගිල්ලක භාවිත අයිතිය ලබා ගන්නා ලදී. මෙම කල්බද්දෙහි විස්තර පහත පරිදි වේ.

| | |
|---|---|
| කල්බදු කාලය | වසර 5 |
| ගොඩනැගිල්ලේ ඵලදායී ජීවකාලය | වසර 25 |
| භාවිත අයිතිය සහිත වත්කමේ මූලික පිරිවැය (Rs.'000) | 2,750 |
| කල්බදු වගකීමේ මූලික වටිනාකම (Rs.'000) | 2,750 |
| වාර්ෂික කල්බදු වාරිකය (Rs.'000) | 820 |
| 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කල්බදු පොලිය (Rs.'000) | 412 |
| 2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කල්බදු පොලිය (Rs.'000) | 350 |

කල්බදු කාලසීමාව අවසානයේදී භාවිත අයිතිය සහිත වත්කමේ අයිතිය සමාගමට. මාරු නොවේ. කල්බදු වාරිකය සෑම වර්ෂයකම මාර්තු 31 දින ගෙවිය යුතු වේ. ඒ අනුව, ප්‍රථම වාර්ෂික කල්බදු වාරිකය 2023.03.31 දින ගෙවන ලද අතර, එය වැරදීමකින් බෙදාහැරීමේ පිරිවැය තුළ ඇතුළත් කර ඇත. මෙම කල්බද්ද සම්බන්ධයෙන් වෙනත් කිසිදු ගිණුම්කරණ සටහනක් තබා නොමැත. භාවිත අයිතිය සහිත වත්කම් සමාගමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි මුහුණතේ වෙනම අයිතමයක් ලෙස ඉදිරිපත් කරනු ලබයි.

IX. ශේෂ පිරික්සුමේ දක්වා ඇති ගෙවූ ආදායම් බදු සමන්විත වන්නේ පසුගිය වසර සඳහා ගෙවූ රු. 320,000 ක් සහ ප්‍රවර්තන වර්ෂයේ ප්‍රථම කාර්තු තුන සඳහා ගෙවන ලද බදු වලිනි. 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු ආදායම් බදු වගකීම රු. 1,200,000 ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇත.

**අවශ්‍ය වන්නේ:**

LKAS 1 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම ප්‍රමිතයට අනුව ප්‍රසිද්ධ කිරීම සඳහා සීමිත දමිත පොදු සමාගමේ පහත මූල්‍ය ප්‍රකාශන (සටහන් ද ඇතුළුව):

අ) 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය

ආ) 2023.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

ඇ) 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

**(මුළු ලකුණු 40)**